**People's Insurance PLC,** No. 07, Havelock Road, P.O. Box 215, Colombo 05.
Tel: +94 11-2126 126 | Fax: +94 11-2126 109 | E-mail: pilassist@plc.lk | www.peoplesinsurance.lk
(A Subsidiary of People's Leasing & Finance PLC and People's Bank) - Company No. PB 3754 PQ



# සංචාරක සංවිධායක වගකීම් රක්ෂණය - රක්ෂණ සැලසුම් පිළිබඳ තොරතුරු ලේඛනය

**ඔප්පු වර්ගය:** සංචාරක මෙහෙයුම්කරුවන්ගේ වගකීම් රක්ෂණය

**ලබා දෙනු ලබන මූලික ආවරණය:**

රක්ෂණ ඔප්පුවට අනුව රක්ෂිත භූමිය තුල සංචාරක මෙහෙයුම්කරුවෙක් වශයෙන් තම ව්‍යාපාර මෙහෙයුම් සිදු කිරීම හේතුවෙන් ඇතිවන හදිසි අනතුරුමය ශාරීරික තුවාල, දේපල හානි, පුද්ගලික හෝ ප්‍රචාරණ තුවාල සම්බන්ධයෙන් ඇතිවන නීතිමය වගකීම් ආවරණය කරනු ලැබේ.
මෙයට ඇතුලත් වන්නේ:

- ශාරීරික තුවාල සහ දේපල හානි වගකීම් (ආවරණය අ)
- පුද්ගලික සහ ප්‍රචාරණ තුවාල සඳහා වන වගකීම් (ආවරණය ආ)
- ආරක්ෂක වියදම් (ආවරණය ඇ) - ඔප්පු සීමාව තුල නීතිමය සහ ඊට අදාළ වියදම්

*(වැඩි විස්තර සඳහා කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 02-07, 1 වෙනි කොටස - ඔප්පුවේ ආවරණය බලන්න)*

**විධිවිධාන:**

ඔප්පුව යටතේ ගෙවිය යුතු මුලු මුදල ඔප්පු උපලේඛනයේ දක්වා ඇති අදාළ රක්ෂණ සීමාවන් ඉක්මවා නොයනු ඇත.

*(වැඩි විස්තර සඳහා කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 08, III වෙනි කොටස - ඔප්පුවේ ආවරණ සීමාව බලන්න)*

**ආවරණය නොවන දේ (පොදු ව්‍යතිරේක):**

**ආවරණය අ - ශාරීරික තුවාල සහ දේපල හානි වගකීම්**

- අපේක්ෂිත හෝ බලාපොරොත්තු වූ තුවාල
- ගිවිසුමකින් පැන නගින වගකීම්
- මත්පැන් වගකිම
- කම්කරු වන්දි සහ ඒ හා සමාන නීතිය
- සේවා යෝජකයාගේ වගකීම
- දූෂණය
- ගුවන් යානා, වාහන හෝ ජල යාත්‍රා
- ජංගම උපකරණ
- යුද්ධය සහ ත්‍රස්තවාදය
- දේපල හානි
- ඔබේ නිෂ්පාදනයට වන හානි

- ඔබේ කර්යයට වන හානි
- ශානියට පත් දේපලට හෝ භෞතිකව තුවාල නොවූ දේපලට හානි වීම
- නිෂ්පාදන, වැඩ හෝ හානියට දේපල ආපසු කැඳවීම

**ආවරණය ආ - පුද්ගලික සහ ප්‍රචාරණ තුවාල සඳහා වන වගකීම්**

පහත සඳහන් කරුණු සඳහා මෙම රක්‍ෂණය අදාළ නොවේ:

අ. පුද්ගලික තුවාල හෝ වෙළඳ දැන්වීම් තුවාල:

1) රක්ෂිතයා විසින් හෝ ඔහුගේ මගපෙන්වීම මත එහි අසත්‍යතාවය පිළිබඳව දැනුවත්ව තිබියදී සිදු කරන ලද වාචික හෝ ලිඛිත ප්‍රකාශන හේතුවෙන් පැන නගින

2) ඔප්පු කාලසීමාව ආරම්භ වීමට පෙර පළමු ප්‍රකාශනය සිදුවූ වාචික හෝ ලිඛිත ප්‍රකාශනයකින් පැන නගින

3) රක්ෂිතයාගේ කැමැත්ත ඇතිව හෝ ඔහු විසින් සිදු කරන ලද දණ්ඩ නීති ප්‍රඥප්තියක් හෝ ආඥා පනතක් හිතාමතා උල්ලංඝනය කිරීමෙන් පැන නගින

4) කොන්ත්‍රාත්තුවක් හෝ ගිවිසුමක් යටතේ රක්ෂිතයා වගකීම භාරගෙන තිබෙන. මෙම බැහැර කිරීම කොන්ත්‍රාත්තුව හෝ ගිවිසුම නොමැති විට රක්ෂිතයාට සිදුවිය හැකි හානි සඳහා වන වගකීම් වලට අදාළ නොවේ. හෝ

5) ඕනෑම අවස්ථාවක දූෂක ද්‍රව්‍ය සත්‍ය, චෝදනා කරන ලද හෝ තර්ජනයට ලක් වූ බැහැර කිරීම, විසුරුවා හැරීම, කාන්දු වීම, සංක්‍රමණය, මුදා හැරීම හෝ ගැලවී යාමෙන් පැන නගින

ආ. පහත සඳහන් කරුණු හේතුවෙන් ඇතිවන ප්‍රචාරණ තුවාල:

1) ඇහවුම් කරන ලද කොන්ත්‍රාත්තුවක් යටතේ ප්‍රචාරණ අදහස් අනිසි ලෙස භාවිතා කර තිබීම හැර, කොන්ත්‍රාත්තුවක් උල්ලංඝනය කිරීම;

2) ප්‍රචාරණය කරන ලද ගුණාත්මකභාවයට හෝ කාර්ය සාධනයට භාණ්ඩ, නිෂ්පාදන හෝ සේවාවන් අනුකූල නොවීම;

3) භාණ්ඩ, නිෂ්පාදන හෝ සේවාවල මිල පිළිබඳව වැරදි විස්තරයක්, හෝ

4) වෙළඳ දැන්වීම්, විකාශන, ප්‍රකාශන හෝ විකාශකය කරන ලද ව්‍යාපාරයක් කරන රක්ෂිතයෙකු විසින් කරන ලද වරදක්.

ඇ. පහත සඳහන් කරුණු හේතුවෙන් ඇතිවන ඕනෑම අලාභයක්, පිරිවැයක් හෝ වියදමක්:

1) ඕනෑම රක්ෂිතයෙකු හෝ වෙනත් අයෙකු දූෂකවල බලපෑම් සඳහා පරීක්ෂා කිරීම, නිරීක්ෂණය කිරීම, පිරිසිදු කිරීම, ඉවත් කිරීම, අඩංගු කිරීම, ප්‍රතිකාර කිරීම, විෂහරණය කිරීම හෝ උදාසීන කිරීම හෝ ඕනෑම ආකාරයකින් ප්‍රතිචාර දැක්වීම හෝ තක්සේරු කිරීම සඳහා ඉල්ලීම, නියෝග කිරීම, හෝ

2) දූෂකවල බලපෑම් සඳහා පරීක්ෂා කිරීම, අධීක්ෂණය කිරීම, පිරිසිදු කිරීම, ඉවත් කිරීම, අඩංගු කිරීම, ප්‍රතිකාර කිරීම, විෂහරණය කිරීම හෝ උදාසීන කිරීම හෝ ඕනෑම ආකාරයකින් ප්‍රතිචාර දැක්වීම හෝ තක්සේරු කිරීම හේතුවෙන් සිදුවන හානි සඳහා රජයේ අධිකාරියක් විසින් හෝ ඒ වෙනුවෙන් හිමිකම් පෑම හෝ නඩු පැවරීම. දූෂක යන්නෙන් අදහස් කරන්නේ,

